# වාර්ෂික වාර්තාව

# 2013

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

# උගත් පාඩම් සහ හොදම පරිචයන්

''අතීතය දෙස විමසීම් සහගතව බැලීම කිසිසේත්ම කාලය අපතේ යැවීමක් නොවේ.

සාර්ථකත්වය හා අනාගත වර්ධනය වෙනුවෙන් පූර්ව ක්‍රියාමාර්ග සහ ලැබූ අත්දැකීම් පිළිබඳව අවබෝධයක් තිබීම ඉතාම වැදගත් වේ. එවැනි පසු විපරමක් කිරීම තුල උගත් පාඩම් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත් ගුණාත්මක ප්‍රතිඵල පෙන්වූ හොඳම ක්‍රියාමාර්ගයන් හඳුනා ගැනීමටත් අවස්ථාව ලැබේ.

අවදානම් හඳුනාගැනීම සඳහාමෙන්ම අවම කරගැනීමේ ක්‍රියාවලිය සඳහා වඩාත් පහසුකම් සලසමින්, අපගේ ශක්තීන් හඳුනාගනිමින් සහ ඉහළ නංවමින් සහඵලදායීතාවය වර්ධනය කරමින් සේවාදායකයා වන හස්ත කර්මාන්ත ශිල්පියාට වඩාත් ඵලදායී නිර්මාණ විසඳුම් රැගෙන එන්නෙමු.

# අන්තර්ගතය


ආයතන පනත හා ලියාපදිංචිය

මග පෙන්වන මුලධර්ම

- දැක්ම
- මෙහෙවර

ආයතනික අරමුණු

හර වටිනාකම්

ආයතන කලමනාකාරීත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

සභාපතිගේ පණිවුඩය

අධ්‍යක්ෂගේ පණිවුඩය

ආයතන ව්‍යුහය

මානව සම්පත්

මූල්‍ය කාර්ය සාධනය

සංවර්ධන ක්‍රියාකාරකම්

සේවා සැපයීම්

**2013** දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අවසාන ගිණුම්

**2013**ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව

## මඟ පෙන්වන මුලධර්ම

### දැක්ම:-

නිර්මාණ සංවර්ධනය හා
නව නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම තුලින්
හස්තකර්මාන්ත ක්ෂේත්‍රය
වඩාත් සක්‍රිය
ආර්ථික ක්ෂේත්‍රයක් බවට පත් කිරීම.

### මෙහෙවර:-

ප්‍රවර්ධනය, සංවර්ධනය,
හැකියාවන් ගොඩනැංවීම,
ප්‍රචලිත කිරීම සහ
ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම තුලින්
වෙළඳපොල පාදක කරගත්
නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම්

ජාතික මෝස්තර මධ්‍යස්ථානය
වාර්ෂික වාර්තාව 2013

## ආයතනික අරමුණු:-

- හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් දැනට නිෂ්පාදනය කරනු ලබන අත්කම් භාණ්ඩ සංවර්ධනය කිරීම සහ දේශිය මෙන්ම අපනයන වෙළඳපළෙහි වර්තමාන සහ අනාගත වෙළඳපල නැමියාවන්ට අනුව නව නිර්මාණ හදුන්වා දීම.

- නිෂ්පාදන ධාරිතාව වැඩිකර ගැනීම සහ උසස් නිමාවකින් යුතු අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම අරමුණු කරගෙන නිසි තාක්ෂණික ක්‍රම හා අමුද්‍රව්‍ය පිළියෙල කරගැනීමේ ක්‍රම හදුන්වා දීම.

- ආදයම් වැඩිකර ගැනීම තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩාත් යහපත් වර්ධනයක් අරමුණු කරගෙන ශිල්පීන්ට උසස් ශිල්පීය, තාක්ෂණික හා මෝස්තර සංවර්ධන පුහුණු සහාය ලබාදීම.

- හස්ත කර්මාන්ත ශිල්පීන්ට නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සැලසීම සහ පොදු පහසුකම් සැලසීම සඳහා පොදු පහසුකම් සේවාවන් ලබාදීම.

- හස්තකර්මාන්ත නිර්මාණ සඳහා වඩාත් කාර්යක්‍ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හදුන්වාදීම.

- ප්‍රකාශණ, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුස්තකාල පහසුකම් සැපයීම මගින් හස්ත කර්මාන්ත ශිල්පීන්ට, අලෙවිකරුවන්ට සහ හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ වී සිටින්නන්ට අවශ්‍ය තොරතුරු ලබාදීම.

- රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් වලට අනුව මෝස්තර උපදේශක සේවාවන් ලබාදීම.

- මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කිරීම සහ වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.

## (Core Values) හර වටිනාකම්

- ✓ අප වගකීමෙන් බැඳී සිටිමු
- ✓ අවංක හා විනිවිදභාවයෙන් යුක්ත වෙමු
- ✓ නිපුනත්වය හා එකමුතු ප්‍රයත්නයන් විශ්වාස කරමු
- ✓ නව තාක්ෂණය හා අභිරුචිය භාවිතා කිරීමට පෙළඹෙමු
- ✓ හොඳ පාරිභෝගික සේවාවක් ලබා දෙන බවට විශ්වාස කරමු

## ආයතන පනත හා ලියාපදිංචිය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද ජාතික මෝස්තර මධ්‍යස්ථානය දේශිය හස්ත කර්මාන්තයේ උන්නතිය උදෙසා හස්තකර්මාන්ත ශිල්පීන් සම්ප්‍රදායෙන් ඔබ්බට ගෙන යමින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය මූලික කරගෙන පිහිටුවනු ලැබූ සේවා සපයන රාජ්‍ය ආයතනයක් වන අතර මේ වන විට සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

## සංවිධානය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය,දේශිය හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසාදැක්ම හා මෙහෙවර අනුව යමින් ආයතනික අරමුණු ඉටු කරගැනීමට නිරතුරුවම ක්‍රියාත්මක වෙමින් සිටී. මෙහිදී මොරටුව, කටුබැද්ද, ද මැල් පාරේ අංක 10 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වයෙන් හා මධ්‍යම පළාත ආවරණය කරමින් මහනුවර, කලාපුරය, නත්තරම්පොත පිහිටුවා ඇති ශාඛා කාර්යාලයේ සහයෝගයෙන් විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් හස්තකර්මාන්ත ශිල්පියා නඟා සිටුවීමට කැපවෙමින් සිටී.

එමෙන්ම සහතික පත් පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා හරහා නව නිර්මාණකරුවන් බිහි කිරීමේ අධ්‍යාපනික ආයතනයක් ලෙස ද කටයුතු කරන ජාතික පිරිනිර්මාණ විද්‍යාලය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අතර, ඒ හරහා නිර්මාණශීලි හැකියාවන් ඇති තරුණ තරුණියන්ට ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර තලය දක්වා වෘත්තීය දැනුමක් ලබා ගැනීමේ අවස්ථාව සළසා ඇත.

එමෙන්ම, නත්තරම්පොත ශාඛා කාර්යාලය තුල ස්ථාපිත පිත්තල, ලාක්ෂා හා සම් ආශ්‍රිත වැඩහල හා පොදු පහසුකම් මධ්‍යස්ථානය මඟින් හස්තකර්මාන්ත ශිල්පියාට අඛණ්ඩ සේවාවක් සපයයි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය සිය දැක්ම ප්‍රධාන කොට ක්‍රියාත්මක  මෙහෙවර තුළින් තම අරමුණු ඉටු කිරීමේදී ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වය ඇතිව හා නත්තරම්පොත පිහිටි ශාඛා කාර්යාලයේ සහයෝගය ඇතිව ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. මීට අමතරව සම්ප්‍රදයික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මඟපෙන්වීමත්, පවතින අනෙකුත් විෂය සමගාමී ආයතන මෙන්ම පළාත් සභා හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හි සහයෝගයත් නිරතුරුව මෙම ආයතනයයේ කාර්යයන් ඉටුකිරීම සඳහා ඉවහල් වන අතර, මෙම ක්ෂේත්‍රයේ නියැලෙන ස්වේච්ඡා සංවිධාන, හස්ත කර්මාන්තකරුවෝ සහ වෙනත් බාහිර ආයතන ඉහත දැක්වෙන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා නිරතුරුව සම්බන්ධ වේ.

සියළුම පරිපාලන, මූල්‍ය, අලෙවි ප්‍රවර්ධන කටයුතු, මෝස්තර සංවර්ධන, මෝස්තර අධ්‍යාපන, තාක්ෂණික සංවර්ධන මෙන්ම පර්යේෂණ හා සංවර්ධන යන ක්ෂේත්‍රයන්ට අදාල කාර්යයන් ද පොදු පහසුකම් හා පුස්තකාල සේවා සැපයීම ආදී ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකිරීමට අදාල සියළුම කාර්යයන් ප්‍රධාන කාර්යාලය මඟින් සිදුකරන අතර පරිපාලන, මූල්‍ය සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු හැර අනෙකුත් සියළු කටයුතු නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය මඟින් ද ඉටු කෙරේ

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රධාන කාර්යාලය | - | අංක 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව. |
| | දුරකථන/ෆැක්ස් අංක | - | 011-2607114 - සභාපති |
| | | | 011-2626345 - අධ්‍යක්ෂ |
| | | | 011-2607814 - පොදු |
| | ෆැක්ස් | | 011-2607111 |
| | ඊ-මේල් | | slndcrisep@yahoo.com / info@slndc.gov.lk |
| (ii) | නත්තරම්පොත පොදු පහසුකම් මධ්‍යස්ථානය සහ වැඩහල | - | කලාපුරය, නත්තරම්පොත. |
| | දුරකථන අංකය / ෆැක්ස් | - | 081-2420038 |

# ආයතනික කළමණාකාරිත්වය

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | | |
|---|---|---|
| ඩී.ඩබ්. මාෂල් ජනතා මහතා | - | සභාපති- ජාතික මෝස්තර මධ්‍යස්ථානය |
| බුද්ධි කීර්තිසේන මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| එස්. ශ්‍රී චන්ද්‍රන් මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| අනෝමා ලෆීර් මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ෂෙරින් ෂේවියර් මෙනවිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| සුජාතා වීරකෝන් මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| එන්. ගොඩකන්ද මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| අනිල් කොස්වත්ත මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| වී. ජෙගරාජසිංහම් මහත්මිය | - | උපදේශක |

### බැංකු කරුවෝ

ලංකා බැංකුව - කටුබැද්ද
මහජන බැංකුව - කටුබැද්ද

### විගණනය

රජයේ විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව

## ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය

| | |
|---|---|
| ඩී.ඩබ්. මාෂල් ජනතා මහතා | - සභාපති- ජාතික මෝස්තර මධ්‍යස්ථානය |
| එම්.ඩී.එස්.එස්.කේ. චන්ද්‍රසිරි මහතා | - අධ්‍යක්ෂ - ජාතික මෝස්තර මධ්‍යස්ථානය |
| ජේ.ඩී.ඩී.ආර්.සී. ගුණරත්න මහතා | - කාර්මික සංවර්ධන ඉංජිනේරු |
| ඩී.ඩී. ගාමිණි මහතා | - සහකාර අධ්‍යක්‍ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු) |
| පී.කේ. විජේසිංහ මහතා | - සහකාර අධ්‍යක්‍ෂ(නත්තරම්පොත) |
| භද්‍රාණි රණවීර මහත්මිය | - ගණකාධිකාරී |

# සභාපතිගේ පණිවුඩය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව හා අනුබද්ධ ආයතන පනතින් ස්ථාපිත 1983 සිට ක්‍රියාත්මක වන ජාතික මෝස්තර මධ්‍යස්ථානය සාම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවා බිම් මට්ටමේ සිට ජාත්‍යන්තරය දක්වා ඔසවා තැබීමට මාහැගි සේවාවක් කල හැකි ජාතික ආයතනයකි.

දැක්ම හා මෙහෙවර අනුව යමින් 2013 වසරේදී ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සිදුකරන ලද සේවාව ප්‍රශංසනීය වේ.

මෙම 2013 වසර ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වසර 30ක පැවැත්ම සංකේතවත් කරන අතර, සේවා සපයන ආයතනයක් වන මෙම ආයතනය ක්‍රියාත්මක වන්නේ මහා භාණ්ඩාගාරයෙන් වෙන් කෙරෙන අරමුදල් වලිනි.

ක්ෂුද්‍ර හා සුළු පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය අනෙකුත් සේවා අතර උපදේශන සේවා පැවැත්වීම අධ්‍යයනය පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පාඨමාලා පැවැත්වීම හරහා මධ්‍යස්ථානය උපයාගත් සංචිත ආදායම පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය වී ඇති බව කැපී පෙනෙන කරුණකි.

සමාලෝචිත වර්ෂයේදී ආයතනික ඉලක්කයන් සපුරා ගැනීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් සහයෝගය හා මගපෙන්වීමත්, කළමණාකරනය, කාර්ය මණ්ඩලය ඇතුලු සියලුම පාර්ශවකරුවන් විසින් ලබාදුන් සහයෝගය සහ කැපවීමත් මම කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

යහ පාලනය ක්‍රමවේදයන් හා අවස්ථානුකූලව අදාල කමිටු පත්කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගනිමින් මෙම ආයතනය ක්‍රියාත්මක වන අතර විදේශ ආධාර ව්‍යාපෘති හරහා පවත්වාගෙන යනු ලබන හස්ත කර්මාන්ත ශිල්පීන් නගා සිටුවීමේ වැඩසටහන් තුල ආයතනය සිය අරමුණු වඩාත් සාක්ෂාත් කරගනිමින් සිටී. ග්‍රාමීය ආර්ථිකයට සවියක් වනු වස් ක්‍රියාත්මක වන මෙම වැඩසටහන් බිම් මට්ටමේ සමාජ ආර්ථික තත්ත්වය වර්ධනය කිරීම කෙරේ මනා පිටුවහලක් වන බව කිව යුතුය.

ග්‍රාමීය ආර්ථිකය ඔසවා තැබීමට ඵලදායි ලෙස දායකත්වය ලබාදෙනු පිණිස මෙම මාහැගි කර්තව්‍යයට උරදෙමින් සිටින ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයටත්, සමස්ත කාර්ය මණ්ඩලයටත් මම මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මාෂල් ජනතා,
සභාපති,
ජාතික මෝස්තර මධ්‍යස්ථානය.

# අධ්‍යක්ෂගේ පණිවුඩය

2013 වර්ෂයේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමට සහ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා ලැබූ මහඟු වරප්‍රසාදයක් කොට සලකමි. ආයතනයේ මූලික අරමුණු වලට සහ ජාතික සංවර්ධන සැලසුම්වලට සමගාමීව ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් මෙම වර්ෂවලදී යම් ප්‍රගාමී ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව සඳහන් කල හැකිය.

රට තුල සාමය සහ ආරක්ෂාව තහවුරු කිරීම තුල ඇතිවී තිබෙන හිතකර වාතාවරණය ආර්ථික වර්ධනය උදාකර ගැනීම සඳහා මහත් ශක්තියක් වී තිබෙන බව පැහැදිලි කරුණකි. නිවැරදිව සකස්කර ඇති පිස්කල් හා මූල්‍ය ප්‍රතිපත්ති මෙරට ආර්ථිකය අඛණ්ඩව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය උත්තේජන සපයා දෙන අතර මෙම තත්ත්වය තුල දේශීය සුලු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ අවධානය යොමු කල යුතුවේ.

හස්ත කර්මාන්තකරුවා නංවාලීම හා ඒ තුල ගැමි ආර්ථිකය ඔසවා තැබීම උදෙසා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරන ජාතික මෝස්තර මධ්‍යස්ථානය ග්‍රාමීය හස්ත කර්මාන්තකරුවා සංවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම උදෙසා ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

ව්‍යවස්ථානුකූල නියමයන්, මෙහෙවර සහ ආයතනික අනිවාර්ය්‍ය අවශ්‍යතාවන් අනුව ජාතික මෝස්තර මධ්‍යස්ථානය තම මිනිස්බල සැලැස්ම සකස් කොට ඇත.

දේශීය අමුද්‍රව්‍ය උපයෝගි කොටගෙන ක්‍රියාත්මක වන ග්‍රාමීය හස්ත කර්මාන්තය ඔප නැංවීම උදෙසා අවශ්‍ය මග පෙන්වීම් සහ අනුබල ලබාදුන් සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්ද මහතාටත් එම නියෝජ්‍ය අමාත්‍ය ගරු වීරකුමාර දිසානායක මහතාටත් අමාත්‍යාංශයේ ලේකම් ශිවඥානසෝදි මහතාටත් සමස්ත කාර්යය මණ්ඩලයටත් මාගේ අවංක කෘතවේදීත්වය මෙයින් පළ කර සිටිමි.

එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි,
අධ්‍යක්ෂ,
ජාතික මෝස්තර මධ්‍යස්ථානය.

# පටුන




| | පිටු අංකය |
|---|---|
| ආයතනික ව්‍යුහය | 12 - 17 |
| මූල්‍ය කාර්යය සාධනය | 18 |
| සංවර්ධන ක්‍රියාකාරකම් | 20 |

| | පිටු අංකය |
|---|---|
| සංවර්ධන ක්‍රියාකාරකම් | 20 - 34 |
| නිර්මාණ ප්‍රදර්ශන | 35 - 36 |
| උපදේශන සේවා | 37 -38 |







| | පිටු අංකය |
|---|---|
| අධ්‍යාපන සේවා | 39 |
| භෞතික ප්‍රගතිය | 40 - 41 |
| නව හස්ත කර්මාන්ත නිමැවුම | 42 - 45 |

# ආයතන ව්‍යුහය



සභාපති
අධ්‍යක්ෂ
නි.අ./ස.අ (පරිපාලන)
නි.අ. (මෝස්තර සංවර්ධන)
නි.අ. (මෝස්තර, අධ්‍යාපන හා පුහුණු)
ගණකාධිකාරී
ස.අ. (මෝස්තර සංවර්ධන)
ස.අ.පර්යේෂණ (රසායනික)
ස.අ.පර්යේෂණ (අලෙවි)
ස.අ.පර්යේෂණ (යාන්ත්‍රික)
පරිපාලන නිලධාරී
ගිණුම් නිලධාරී
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක
අභ්‍යන්තර විගණන නිලධාරී
මෝස්තර සම්පාදක
වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී
සංවර්ධන සහකාර
සංවර්ධන සහකාර
අලෙවි සහකාර
පුස්තකාල/තොරතුරු සහකාර
පෞද්ගලික සහකාර
පෞද්ගලික සහකාර
කළමණාකරන සහකාර
කළමණාකරන සහකාර
ශිල්ප උපදේශක
කළමණාකරන සහකාර
කළමණාකරන සහකාර
කළමණාකරන සහකාර
රියදුරු
කාර්යාල සහායක
මුරකරු

## මානව සම්පත

| තනතුරු නාමය | සේවා ශ්‍රේණිය | අනුමත | පවතින | පුරප්පාඩු | අධීක්ෂණ නිළධාරී |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | HM 1-3 | 01 | 01 | - | සභාපති |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන හා පර්යේෂණ | MM 1-1 | 01 | - | 01 | අධ්‍යක්ෂ |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු) | MM 1-1 | 01 | - | 01 | |
| සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | MM 1-1 | 01 | - | 01 | |
| සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) | MM 1-1 | 01 | - | 01 | |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා යාන්ත්‍රික) | MM 1-1 | 01 | 01 | - | |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා අලෙවි) | MM 1-1 | 01 | - | 01 | |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා රසායනික) | MM 1-1 | 01 | - | 01 | |
| ගණකාධිකාරී | MM 1-1 | 01 | 01 | - | |
| පරිපාලන නිළධාරී | JM 1-1 | 01 | 01 | - | |
| ගිණුම් නිළධාරී | JM 1-1 | 01 | 01 | - | |
| විගණන නිළධාරී | JM 1-1 | 01 | - | 01 | |
| ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක | JM 1-1 | 04 | 05 | - | |
| මෝස්තර සම්පාදක | MA 5-1 | 09 | 07 | 02 | |
| වැඩසටහන් සම්බන්ධීකාරක | MA 5-1 | 01 | - | 01 | |
| අලෙවි සහකාර | MA 3 | 01 | - | 01 | |
| පුස්තකාල හා තොරතුරු සහකාර | MA 3 | 01 | - | 01 | |
| සංවර්ධන සහකාර | MA 3 | 03 | 02 | 01 | |
| පෞද්ගලික සහකාර | MA 2-1 | 02 | 02 | - | |
| කළමණාකරණ සහකාර | MA 1-1 | 10 | 14 | අතිරික්ත 4 | |
| ශිල්ප උපදේශක | MA 1-1 | 32 | 16 | 16 | |
| පුහුණු සහායක | PL 1-1 | 01 | 01 | - | |
| රියැදුරු | PL 3 | 06 | 04 | 02 | |
| කාර්යාල සහායක | PL 1-1 | 17 | 09 | 08 | |
| මුරකරු | PL 1-1 | 04 | 07 | අතිරික්ත 3 | |

# උපදේශකත්වය හා සමස්ත අධීක්ෂණය

| සභාපති | | |
|---|---|---|
| තනතුර | අනුමත | පවතින |
| අධ්‍යක්ෂ | 01 | 01 |

# මෙහෙයවීම

| තනතුර | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 02 | -- | 02 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ(පාලන) | 01 | -- | 01 |
| සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ(යාන්ත්‍රික) | 01 | 01 | -- |
| සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) | 01 | -- | 01 |
| සහකාරඅධ්‍යක්ෂ පර්යේෂණ(අලෙවි) | 01 | -- | 01 |
| සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ(රසායනික) | 01 | -- | 01 |
| ගණකාධිකාරී | 01 | 01 | -- |



## සංවර්ධන ක්‍රියාවලියට සෘජුව සම්බන්ධවූවෝ

| තනතුර | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන හා පර්යේෂණ) | 01 | -- | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා සංවර්ධන) | 01 | -- | 01 |
| සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ (අලෙවි) | -- | -- | -- |
| ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක | 04 | 05 | |
| මෝස්තර සම්පාදක | 09 | 08 | 01 |
| අලෙවි සහකාර | 01 | 01 | |
| ශිල්ප උපදේශක | 32 | 15 | 17 |
| පුහුණු සහායක | -- | 03 | |



## සංවර්ධන ක්‍රියාවලියට වක්‍රව සම්බන්ධවූවෝ

| තනතුර | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ පරයේෂණ (යාන්ත්‍රික) | 01 | 01 | |
| ගණකාධිකාරී | 01 | 01 | |
| පරිපාලන නිලධාරී | 01 | 01 | |
| අභ්‍යන්තර විගණක | 01 | -- | 01 |
| ගිණුම් නිලධාරී | 01 | 01 | |
| වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී | 01 | -- | 01 |
| සංවර්ධන සහකාර | 03 | 02 | 01 |
| පුස්තකාල/තොරතුරු සහකාර | 01 | -- | 01 |
| පෞද්ගලික සහකාර | 02 | 02 | |
| කළමණාකරන සහකාර | 10 | 14 | |
| රියැදුරු | 06 | 04 | 02 |
| කාර්යාල සහායක | 17 | 09 | 08 |
| මුරකරු | 04 | 07 | |



## සංවිධාන ධූරාවලිය


සභාපති
අධ්‍යක්ෂ
අලෙවි හා තොරතුරු අංශය
• සහකාර අධ්‍යක්ෂ (අලෙවි) වැ.බ
• අලෙවි සහකාර කළමණාකරන සහකාර
පුස්තකාලය
• පුස්තකාල සහකාර
පරිපාලන අංශය
• නි.අ/ස.අ පරිපාලන
• පරිපාලන නිලධාරී
• පෞද්ගලික සහකාර
• කළමණාකරන සහකාර
• රියදුරු
• කාර්යාල සහායක
• මුරකරු
ගිණුම් අංශය
• ගණකාධිකාරී
• ගිණුම් නිලධාරී
• සංවර්ධන සහකාර
• කළමණාකරන සහකාර
• සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ - රසායනික)
මෝස්තර සංවර්ධන අංශය
• නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන)
• ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක
• මෝස්තර සම්පාදක
• කළමණාකරන සහකාර
වැඩහල
• සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ යාන්ත්‍රික
• ශිල්ප උපදේශක
• පුහුණු සහයක
මෝස්තර අධ්‍යාපන හා පුහුණු අංශය
• නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු)
නත්තරම්පොත ශාඛා කාර්යාලය
• සහකාර අධ්‍යක්ෂ
• මෝස්තර සම්පාදක
• කළමණාකරන සහකාර
• ශිල්ප උපදේශක
• රියදුරු
• කාර්යාල සහායක
• මුරකරු

## මූල්‍ය කාර්ය සාධනය

මූලික වශයෙන් සේවා සපයන ආයතනයක් ලෙස ක්‍රියා කරන ජාතික මෝස්තර මධ්‍යස්ථානය, රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල යටතට ගැනෙන අතර ඊට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙතින් සපයා ගනු ලබයි.

2013 වසරේඅනුමත අයවැය සහ භාණ්ඩාගාරය වෙතින් ලැබූ ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රතිපාදන පිළිබඳ දත්ත හා තොරතුරු පහත දැක්වේ.

## ප්‍රාග්ධන ප්‍රතිපාදන




## පුනරාවර්තන ප්‍රතිපාදන



ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් ඉටු කරනු ලබන සේවා අතර උපදේශන සේවාව විශේෂ ස්ථානයක් ගනු ලබන අතර උපදේශන සේවා සඳහා අයකරන ගාස්තු, මෙන්ම පිරිනිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා අය කෙරෙන ගාස්තු මඟින් ද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අනුග්‍රහයෙන් සිදුකරනු ලබන නව නිර්මාණ සංවර්ධන හා පුහුණු වැඩසටහන් මෙන්ම ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදනද ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ අරමුදලට එක් වන අතර ඒ අනුව මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන අරමුදල් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. | ජාතික මෝස්තර මධ්‍යස්ථාන අරමුදල | (NDC) |
| 2. | සේවක ණය අරමුදල | (SLC) |
| 3. | මෝස්තර උපදේශක සේවා අරමුදල | (DCF) |
| 4. | අලෙවි පර්යේෂණ අරමුදල | (TMF) |
| 5. | මෝස්තර අධ්‍යාපන හා පුහුණු අරමුදල | (DET) |

# සංවර්ධන ක්‍රියාකාරකම්

## <u>නව නිර්මාණ සැලසුම් කිරීම සහ සංවර්ධනය</u>

නව නිර්මාණ සැළසුම් කිරීම හඳුන්වා දීම හා සංවර්ධනය කිරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ කාර්ය භාරයන් හි ප්‍රමුඛ කාර්යයක් වන අතර ඒ තුලින් ග්‍රාමීය හස්ත කර්මාන්ත ශිල්පියා සවිබල ගැන්වීමත් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල ඉලක්ක කොට කාලින නිර්මාණ හදුන්වාදෙමින් ග්‍රාමීය ආර්ථිකය ඉහළ නංවනු වස් හස්ත කර්මාන්තකරුවන් පෙළගැස්මත් අත්‍යාවශ්‍ය කටයුත්තකි.

මේ සදහා දේශීය අමුද්‍රව්‍ය යොදා ගැනෙන අතර සාම්ප්‍රදායික නිෂ්පාදන වලින් ඔබ්බට යමින් නව වෙළඳපලකට ප්‍රවේශ වීමට හස්තකර්මාන්ත ශිල්පියාට නිරතුරුව මඟපෙන්වන්නෙක් ලෙස ජාතික මෝස්තර මධ්‍යස්ථානය ක්‍රියා කරයි.

හස්තකර්මාන්ත විෂය තුල විහිදී ඇති සියළුම ක්ෂේත්‍ර සඳහා නව මෝස්තර නිර්මාණය කිරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානය මගින් සිදු කෙරෙන අතර පන් හා කෙඳි, රතු මැටි, කොහු, උණ හා වේවැල්, රෙදිපිළි, දැව, ලාක්ෂා, පිත්තල, සම් හා ආභරණ යන ක්ෂේත්‍ර මින් ප්‍රමුඛ ස්ථානය ගනී.

කාලින වෙළදපොළ අපේක්ෂාවන් හදුනා ගනිමින් නව්‍යකරණයෙන් යුත් නිර්මාණ නව සංකල්පයන් ඔස්සේ මූර්තිමත් කරමින් සම්මත රාමුවෙන් බැහැරව ඉදිරිපත් කිරීම සේම මෝස්තර මධ්‍යස්ථාන සේවා ලාභීන්ගේ ඉල්ලීම් මත නව මෝස්තර නිර්මාණකරණය මෙම ආයතනය මගින් සිදුවන අතර රජයේ විශේෂ අවධානයට යොමුව ඇති සමරු හා ත්‍යාග භාණ්ඩ වෙනුවෙන් හස්තකර්මාන්ත ක්ෂේත්‍රය හරහා නව නිර්මාණ එළිදැක්වීම කෙරෙහි ජාතික මෝස්තර මධ්‍යස්ථානය වගකීමෙන් බැඳී සිටී.

2013 වසර තුල නව මෝස්තර සැලසුම් කිරීම හා සංවර්ධනය ඉහත පරිදි ඉලක්කගත අරමුණු අනුව යමින් මෙන්ම දේශීය හා විදේශීය වෙළඳපල කේන්ද්‍ර කොට ගෙන නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදෙන හස්ත කර්මාන්තකරුවා හා කුඩා කර්මාන්තකරුවා ඔසවා තබනු වස් කාලීන හා ඉල්ලුම සහිත නිර්මාණ සම්පාදනය කරමින් පහත ආකාරයට ක්‍රියා කර ඇත.



## නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්ථනය කිරීම.

නව නිර්මාණ සංකල්ප වලින් තෝරාගත් නිර්මාණ, මොරටුව සහ නත්තරම්පොත කාර්යාල පරිශ්‍රය තුල පිහිටි වැඩහල් මඟින් මූලාදර්ශ ලෙස සංවර්ධනය කිරීම සිදු කෙරෙන අතර වැඩහල තුල නිෂ්පාදනය කළ නොහැකි නිර්මාණ පිටත ශිල්පීන් මඟින් නිෂ්පාදනය කර ගැනීමට කටයුතු කෙරේ. ඒ අනුව වාර්ෂික ඉලක්කය, වැඩහල තුල 315ක් හා පිටත ශිල්පීන් මඟින් 50ක් සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. මෙහිදී පිත්තල, ලාක්ෂා හා සම් ආශ්‍රිත නව නිර්මාණ 102ක් නත්තරම්පොත වැඩහල තුලින් මූලාදර්ශ බවට පත් කෙරුණු අතර, පන් හා කෙඳි, රතු මැටි, කොහු, උණ හා වේවැල්, රෙදිපිළි, දැව යන ක්ෂේත්‍ර මූලික කොට කරන ලද නිර්මාණ 278ක් මොරටුව වැඩහල තුල මූලාදර්ශ බවට පත් කෙරුණි.

ඒ අනුව 2013 වර්ෂයේදී වැඩහල් තුල 380ක් හා පිටත ශිල්පීන් මඟින්15ක් නව නිර්මාණ සංවර්ධනය කරමින් මුළු නව නිර්මාණ මූලාදර්ශ 395ක් හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට එළිදැක්වීමට හැකියාව ලැබුණි.

ව්‍යාපෘති හරහා ආයතනය විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් හා පළාත්සභා, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හරහා ක්‍රියාත්මක ශිල්පීය පුහුණු වැඩසටහන් තුලදී මෙම මූලාදර්ශ ශිල්පියාට හඳුන්වා දී ඔවුන් එම නව නිර්මාණ නිෂ්පාදනයට යොමු කරවීමට ක්‍රියා කරන අතර, නව නිර්මාණ ප්‍රදර්ශන හා අලෙවි සල්පිල් මඟින් වැඩි ප්‍රමාණයක් ජාතික මෝස්තර මධ්‍යස්ථානයට සේවා ලබාගැනීම සඳහා පැමිණෙන ශිල්පීන් මඟින්, පළාත්සභා, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හරහා ක්‍රියාත්මක ශිල්පීය පුහුණු වැඩසටහන් මඟින්, නව නිර්මාණ ප්‍රදර්ශන හා අලෙවි සල්පිල් මඟින් සහ ශ්‍රී ලංකා හස්තකර්මාන්ත මණ්ඩලය හරහා වෙළඳපලට හඳුන්වාදීමට කටයුතු කර ඇත .




## නව හස්තකර්මාන්ත නිර්මාණ ඔස්සේ සමරු නිර්මාණ එළිදැක්වීම

පසු ගිය වසරට සමගාමීව නිර්මාණ සංවර්ධනය හා නව නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම තුල හස්තකර්මාන්ත ක්ෂේත්‍රය වඩාත් සක්‍රිය වී ඇති අතර විශේෂයෙන්ම ග්‍රාමීය ආර්ථික ක්ෂේත්‍රය ජාතික සංවර්ධන වැඩපිළිවෙල ඔස්සේ ඉහළින් තැබීම පිණිස ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්තකර්මාන්ත ක්ෂේත්‍රය තුල කැපී පෙනෙන වැඩ කොටසක් ඉටු කොට ඇත.දේශීය හස්තකර්මාන්ත ශිල්පියාගේ ජීවන තත්ත්ව ඉහල නැංවීම උදෙසා දේශීය සංචාරක කර්මාන්තයේ දැවැන්ත සංවර්ධනය සමඟින් මෙරටට පැමිණෙන සංඛ්‍යාත්මක සංචාරක ප්‍රවර්ධනය කෙසේ ඉවහල් වන්නේද යන්න පිළිබඳ අවධානය යොමු කෙරෙන අතර එහිදි විදේශිකයන් ඉලක්ක කොට නිමැවෙන සමරු හා ත්‍යාග භාණ්ඩ ප්‍රමුඛ ස්ථානයක් ගනී.

එබැවින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය, දේශීය අනන්‍යතාවය පිළිඹිබු කෙරෙන සමරු හා ත්‍යාග භාණ්ඩ කෙරෙහි අවධානය යොමු කරමින් නව නිර්මාණ එළිදැක්වීමටත්, එම නිර්මාණ හස්තකර්මාන්ත ශිල්පියාට හඳුන්වාදීමටත් ක්‍රියා කර ඇත. ඒ හරහා ඉලක්ක කළ සමරු හා ත්‍යාග භාණ්ඩ 24ක් වෙනුවෙන් පාර්ලිමේන්තුව, අනුරාධපුරය, දළඳා මාළිගය, දේශීය අලියාගේ විවිධ ස්වරූපයන් වැනි දේශීය වටිනාකමක් ඇති දේ ඉලක්ක කරගනිමින් සමරු නිර්මාණයන් 42ක් නිර්මාණය කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

## නව නිර්මාණ සංවර්ධන වැඩසටහන්

නිරතුරුව වෙළඳපොල නැමියාවන් හදුනා ගනිමින් කටයුතු කරන ජාතික මෝස්තර මධ්‍යස්ථානය, වෙළඳපලට ගැලපෙන මෙන්ම වෙළඳපල තුල ඉල්ලුමක් ඇති කළ හැකි නව නිර්මාණ බිහි කරමින් ඒවා හස්තකර්මාන්ත ශිල්පියා හරහා වෙළඳපොලට ප්‍රවිෂ්ඨ කිරීමට කටයුතු කරයි.

මෙහිදී මහින්ද චින්තන ඉදිරි දැක්ම සංවර්ධන වැඩසටහන තුලින් හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට ඉටුවිය යුතු මෙහෙවර පිළිබඳ මනා අවබෝධයකින් යුතුව ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම දිවි නැගුම සංවර්ධන වැඩසටහන, වැඩ කරන ජනතාවට ඒ තුලින් ඵලදායි මාවතක් විවර කරන්නට මූල්‍ය දායකත්වය ලබාදෙමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇති දැවැන්ත සංවර්ධන වැඩසටහනකි, මීට අමතරව, හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ආරම්භ කෙරුණු සාම්ප්‍රදායික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන ද මෙම වර්ෂය තුල ආරම්භ කෙරුණු ඵලදායි ව්‍යාපෘතියකි.

මෙම සියළු සංවර්ධන වැඩසටහන් වලට දායකත්වය ලබාදෙමින්, සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම හා උපදේශකත්වය යටතේ, විවිධ පළාත් ආවරණය කරමින් පහත සඳහන් ආකාරයට නව නිර්මාණ පිළිබඳ දැනුවත් කිරීමේ හා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානයට හැකියාව ලැබුණි.

**ඉලක්කය**

**නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් - 65**

**ප්‍රතිලාභීන් - 1405**

**සපුරා ගැනිම**

**නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් - 75**

**ප්‍රතිලාභීන් - 2115**

## 2013 වසරේ පවත්වන ලද නව නිර්මාණ සංවර්ධන වැඩ සටහන්

| | වැඩසටහනේ ස්වභාවය | විශේෂ සටහන් | ක්ෂේත්‍රය | ස්ථානය | ආරම්භක දිනය හා දින ගණන | මූල්‍ය දායකත්වය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යව | වගකීම දරන නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | යු.එන්.ඩී.පී ව්‍යාපෘතිය | තල්කොළ | යාපනය - මට්ටුවිල් | ජනවාරි 7 | යූඑන්ඩීපී ආයතනය | 23 | 3 | එබ් .එම් .පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 2 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | යු.එන්.ඩී.පී ව්‍යාපෘතිය | තල්කොළ | යාපනය- වෙලනි | ජනවාරි 7 | යූඑන්ඩීපී ආයතනය | 16 | 5 | චන්න පෙරේරා මයා - මෝස්තර සම්පාදක |
| 3 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | යු.එන්.ඩී.පී ව්‍යාපෘතිය | තල්කොළ | යාපනය- වෙලනි | ජනවාරි 7 | යූඑන්ඩීපී ආයතනය | 18 | 5 | එස්. ගම්ලත් මිය සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 4 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | තිර රෙදි | ගාල්ල | ජනවාරි 31 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 29 | 7 | තමරා දමයන්ති මිය- සහකාරඅධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 5 | නව නිර්මාණ මූලික පුහුණු වැඩසටහන | යු.එන්.ඩී.පී ව්‍යාපෘතිය | තල්කොළ | මුලතිව්- වෙම්මලෙ | පෙබරවාරි 11 දින 5 | යූඑන්ඩීපී ආයතනය | 42 | 4 | චන්න පෙරේරා මයා - මෝස්තර සම්පාදක |
| 6 | නව නිර්මාණ මූලික පුහුණු වැඩසටහන | යු.එන්.ඩී.පී ව්‍යාපෘතිය | තල්කොළ | මුලතිව්- පුතුකුඩුඉරුප්පු | පෙබරවාරි 11 දින 5 | යූඑන්ඩීපී ආයතනය | 35 | 5 | එස්. ගම්ලත් මිය සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | නව නිර්මාණ මූලික පුහුණු වැඩසටහන | යූ.එන්.ඩී.පී ව්‍යාපෘතිය | තල්කොළ | කිලිනොච්චි- පච්චිලයිපලෛ | පෙබරවාරි 11 දින 5 | යූඑන්ඩීපී ආයතනය | 31 | 3 | ඩබ්.එම්.පියරත්න මයා සහකාරඅධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |
| 8 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | උණ හා වේවැල් | ගම්පහ-රදවඩුන්න | පෙබරවාරි 21 දින 3 | | 17 | 5 | ඩබ්.එම්.පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 9 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | නවකයින් සඳහා | සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | පෙබරවාරි 18 දින 2 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 15 | 3 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 10 | දැනුවත් කිරීමේ වැඩසටහන | | රතුමැටි | මඩකලපුව | පෙබරවාරි 28 දින 1 | අමාත්‍යාංශය | 50 | | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 11 | දැනුවත් කිරීමේ වැඩසටහන | | රතුමැටි | කොළඹ-රනාල | පෙබරවාරි 8 දින 01 | කාර්මික සංවර්ධන මණ්ඩලය | 35 | | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 12 | දැනුවත් කිරීමේ වැඩසටහන | | දැව ආශ්‍රිත | අම්බලන්ගොඩ- ගාල්ල | පෙබරවාරි 8 දින 1 | ජාතික සංවර්ධන බැංකුව | 50 | | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 13 | නව නිර්මාණ හා තාක්ෂණය හදුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන | සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන | දැව ආශ්‍රිත | ගාල්ල- බෝපේ පෝද්දල | මාර්තු 20 දින 3 | අමාත්‍යාංශය | 36 | 15 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 14 | දැනුවත් කිරීමේ වැඩසටහන | දිවි නැගුම | දැව ආශ්‍රිත | ගාල්ල | මාර්තු 22 දින 1 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 62 | | ඩබ්.එම්.පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 15 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | | උණ හා වේවැල් | ගාල්ල- බද්දේගම | මාර්තු 27 දින 02 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 22 | | ඩබ්.එම්.පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 16 | දැනුවත් කිරීමේ වැඩසටහන | දිවි නැගුම | දැව ආශ්‍රිත | ගාල්ල | මාර්තු 27 දින 2 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 38 | | ඩබ්.එම්.පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 17 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | | රෙදිපිළි | මාතර-වැලිගම | මාර්තු 21 දින 1 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 29 | | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 18 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | විශ්ව විද්‍යාල සිසුන් | උණ හා වේවැල් | කොළඹ-මොරටුව | මාර්තු 1 දින 2 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 20 | | ඩබ්.එම්.පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 19 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | උපදේශිකාවන් සඳහා | තල්කොළ | වවුනියා | මාර්තු 18 | වාණිජ මණ්ඩලය | 30 | 40 | එස්. ගම්ලත් මිය සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 20 | දැනුවත් කිරීමේ වැඩසටහන | | කොහු | කළුතර | | | 20 | 4 | වන්න පෙරේරා මයා මෝස්තර සම්පාදක |
| 21 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | දිවි නැගුම | දැව ආශ්‍රිත | ගාල්ල-දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | අප්‍රේල 02 - දින 02 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 40 | 24 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| | පොදු දැනුවත් කිරීමේ වැඩසටහන් 06 | ශිල්ප ප්‍රදර්ශණය සඳහා | | යාපනය, මුලතිව් වවුනියා,මන්නාරම, අනුරාධපුරය, පොලොන්නරුව, | අප්‍රේල 02,03,04,05 , 21, 22 | ජාතික ශිල්ප සභාව | 191, 65, 150,51, 110,69 (636) | | විජිත බණ්ඩාර මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| | පොදු දැනුවත් කිරීමේ වැඩසටහන් 07 | ශිල්ප ප්‍රදර්ශණය සඳහා | | අම්බලන්තොට, මාතර,ගාල්ල, මොනරාගල, බදුල්ල, කුරුණෑගල, හලාවත | අප්‍රේල් 1,2,3,5,6, 24,26 | ජාතික ශිල්ප සභාව | 51, 157,118 54, 86,252, 103- (821) | | ඩබ්.එම්.පියරත්න මයා සහකාර අධ්‍යකෂ (මෝස්තර සංවර්ධන) |
| | පොදු දැනුවත් කිරීමේ වැඩසටහන් 03 | ශිල්ප ප්‍රදර්ශණය සඳහා | | නුවරඑළිය,මහනුවර , මාතලේ | අප්‍රේල් | ජාතික ශිල්ප සභාව | 450 | | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |
| 22 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | තිර රෙදි | නත්තරම්පොත | මැයි | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 24 | 10 | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 23 | පුහුණු වැඩසටහන | | ස්ක්‍රීන් මුද්‍රණ | නත්තරම්පොත | මැයි | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 29 | 5 | පි.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |
| 24 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | උණ හා පන් මිශ්‍රිත | අගුණකොළපැලැස්ස- විදතා මධ්‍යස්ථානය - හම්බන්තොට | මැයි | ජාතික මෝස්තර මධ්‍යස්ථානය හා විදතා මධ්‍යස්ථානය | 16 | 5 | ඩබ්.එම්.පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 25 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | GIZ | කෙසෙල් කෙඳි | යාපනය | ජූනි 27-ජූලි 7 | GIZ | 40 | 22 | චන්න පෙරේරා මයා මෝස්තර සම්පාදක |
| 26 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | රතුමැටි | යක්විල - කුරුණෑගල | මැයි | | 15 | 8 | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| | පොදු දැනුවත් කිරීමේ වැඩසටහන් 06 | ශිල්ප ප්‍රදර්ශණය සඳහා | | අම්පාර,ත්‍රිකුණාමලය, මඩකලපුව | මැයි | ජාතික ශිල්ප සභාව | 46,24,78 - 148 | | විජිත බණ්ඩාර මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 27 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | දිවි නැගුම | දැව ආශ්‍රිත | මාතර | මැයි | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 38 | 22 | බර්නාඩ් මනතුංග මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 28 | නව තාක්‍ෂණික පුහුණු වැඩසටහන | | පිත්තල | කිරිවවුල- මහනුවර | මැයි | ශිල්ප සංවර්ධන සමිතිය මෝස්තර මධ්‍යස්ථානය | 12 | | ටොරින් චන්ද්‍රසේකර මයා මෝස්තර සංවර්ධන නිලධාරී |
| 29 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | රෙදිපිළි | වෙරළුපේ - රත්නපුර | මැයි | ජාතික ශිල්ප සභාව | 22 | 2 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්‍ෂ (මෝස්තර සංවර්ධන) |
| 30 | දැනුවත් කිරීමේ වැඩසටහන | | පන් හා කෙඳි | කොළඹ | ජූනි-21 | හොරණ පොදුජන හිමිකම් කමිටුව ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 30 | | එස්. ගම්ලත් මිය සහකාර අධ්‍යක්‍ෂ (මෝස්තර සංවර්ධන) |
| 31 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | පන් හා කෙඳි | වීරවිල- හම්බන්තොට | ජූනි-15- දින 03 | ජාතික ශිල්ප සභාව | 24 | 17 | එස්. ගම්ලත් මිය සහකාර අධ්‍යක්‍ෂ (මෝස්තර සංවර්ධන) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 32 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | සම් හා පන් මිශ්‍රිත | අනුරාධපුරය | ජූනි-25- දින 04 | | 27 | 8 | එස්. ගම්ලත් මිය සහකාර අධ්‍යක්‍ෂ (මෝස්තරසංවර්ධන) පි.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |
| 33 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | රෙදිපිලි | ජාතික මෝස්තර මධ්‍යස්ථානය - කොළඹ | ජූනි-24- දින 03 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 15 | 5 | තමරා දමයන්ති මිය සහකාර අධ්‍යක්‍ෂ (මෝස්තර සංවර්ධන) |
| 34 | දැනුවත් කිරීමේ වැඩසටහන | | උණ හා වේවැල් | මොනරාගල | ජූනි-15 | ජාතික ශිල්ප සභාව | 26 | | ඩබ්.එම්.පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 35 | දැනුවත් කිරීමේ වැඩසටහන | | වේවැල් | මොනරාගල | ජූනි-16 | ජාතික ශිල්ප සභාව | 11 | | ඩබ්.එම්.පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 36 | නව තාක්‍ෂණික පුහුණු වැඩසටහන | | උණ බට | මහනුවර - ගලේවෙල | ජූනි-3 දින 02 | මධ්‍යම පළාත් කර්මාන්ත දෙපා: | 19 | | ඩබ්.එම්.පියරත්න මයා සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 37 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | උණ බට | මහනුවර - ගලේවෙල | ජුනි-24 දින 05 | | 19 | 21 | ඩබ්.එම්.පියරත්න මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 38 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | පිත්තල | මඩවල- මහනුවර | ජුනි-9 දින 02 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 10 | 10 | ටොරින් චන්ද්‍රසේකර- මෝස්තර සංවර්ධන නිලධාරී |
| 39 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ස.හ.ග.ස. ව්‍යා. | ලාක්ෂා | පහල හපුවිද- මාතලේ | | අමාත්‍යාංශය | 42 | 40 | පී.කේ. විජේසිංහ මයා සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |
| 40 | උසස් තාක්‍ෂණික පුහුණු වැඩසටහන | | බතික් | වටවල - නුවරඑළිය | ජුනි-6 දින 10 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 20 | 05 | පී.කේ. විජේසිංහ මයා - සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |
| 41 | දැනුවත් කිරීමේ වැඩසටහන | ස.හ.ග.ස.ව්‍යා. | වෙස්මුහුණු | මව්ගම-හොරණ- කළුතර | ජුනි-22 | අමාත්‍යාංශය | 20 | | විජිත බණ්ඩාර මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 42 | දැනුවත් කිරීමේ වැඩසටහන | ස.හ.ග.ස.ව්‍යා. | සංගීත භාණ්ඩ | කුරගල- මහනුවර | ජුනි-29 | අමාත්‍යාංශය | 30 | | විජිත බණ්ඩාර මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 43 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | කොහු | පුත්තලම - මාදම්පේ ප්‍රා.ලේ.කා. | ජුලි-2 දින 3 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය හා විදාතා | 13 | 07 | බර්නාඩ් මනතුංග මයා- සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 44 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | දැව | අම්පාර - උහන- පළාත් කර්මාන්ත අමාත්‍යාංශය | ජූලි 30 දින 2 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 26 | 21 | බර්නාඩ් මනතුංග මයා- සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 45 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | නවකයින් සඳහා | රෙදිපිලි සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | ජාතික මෝස්තර මධ්‍යස්ථානය නත්තරම්පොත | ජූලි 26 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 13 | 02 | තමරා දමයන්ති මිය- සහකාර අධ්‍යක්‍ෂ (මෝස්තර සංවර්ධන) |
| 46 | නව නිමාව හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන | ස.හ.ග.ස.ව්‍යා. | සංගීත භාණ්ඩ | කූරගල- මහනුවර | ජූලි-15 සහ 23 අගෝ.1,7, 8,13 | අමාත්‍යාංශය | 40 | | විජිත බණ්ඩාර මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 47 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | රතමැටි - විසිතුරු භාණ්ඩ හා ගැස් වළං | කුරුණෑගල - කණුමලේ | ජූලි 29 - දින 3 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 29 | 5 | විජිත බණ්ඩාර මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 48 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | සම් ආශ්‍රිත | බෝගම්බර බන්ධනාගාරය මහනුවර | ජූලි 26- දින 4 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 22 | 4 | පි.කේ. විජේසිංහ මයා - සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 49 | නව නිර්මාණ හා තාක්‍ෂණික පුහුණු වැඩසටහන | නව තාක්‍ෂණික | උණ හා වේවැල් | මහනුවර - ගලේවෙල - දැව පුහුණු මධ්‍යස්ථානය | ජූලි 8- දින 3 | මධ්‍යම පළාත් කර්මාන්ත දෙපා: | 19 | 3 | ඩබ්.එම්.පියරත්න මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 50 | දැනුවත් කිරීමේ වැඩසටහන | | උණ හා වේවැල් | බැද්දේගම - ගාල්ල | ජූලි 26 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 32 | | ඩබ්.එම්.පියරත්න මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 51 | දැනුවත් කිරීමේ වැඩසටහන,නව නිර්මාණ,නව නිමාව හදුන්වාදීම | ස.හ.ග.ස.ව්‍යා. | සංගීත භාණ්ඩ | හිත්තටිය - මාතර | ජූලි-19 සැප්තැම්බර් 13 .දෙසැම්බර් 5,19 | අමාත්‍යාංශය | 8 | 3,6 | ඩබ්.එම්.පියරත්න මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 52 | දැනුවත් කිරීමේ වැඩසටහන,නව නිර්මාණ,නව නිමාව හදුන්වාදීම | ස.හ.ග.ස.ව්‍යා. | සේසත් | උණවේරුව- මාතලේ | අගෝස්තු- 8 සැප්තැම්බර් 18 ..... | අමාත්‍යාංශය | 28 | 4 | එස්. ගම්ලත් මිය -සහකාර අධ්‍යක්‍ෂ (මෝස්තර සංවර්ධන) |
| 53 | දැනුවත් කිරීමේ වැඩසටහන | දිවි නැගුම | දැව | කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | සැප්තැම්බර් 14 දින 1 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 25 | 22 | බර්නාඩ් මනතුංග මයා- සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 54 | දැනුවත් කිරීමේ වැඩසටහන | TOT | උණ ලී ආශ්‍රිත | ගාල්ල-බද්දේගම - ගිනිමැල්ල උණ ලී මධ්‍යස්ථානය | සැප්තැම්බර් 5,6,7- දින 03 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 24 | 6 | ඩබ්.එම්.පියරත්න මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 55 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | නවකයින් සඳහා | උණ ලී ආශ්‍රිත | පුත්තලම - නාත්තන්ඩිය | සැප්තැම්බර් 16,17,18- දින 03 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 23 | 4 | ඩබ්.එම්.පියරත්න මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 56 | දැනුවත් කිරීමේ වැඩසටහන | TOT | වේවැල් ආශ්‍රිත | ගාල්ල-බද්දේගම - ගිනිමැල්ල උණ ලී මධ්‍යස්ථානය | සැප්තැම්බර් 5,6,7- දින 03 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 24 | 6 | ඩබ්.එම්.පියරත්න මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 57 | දැනුවත් කිරීමේ වැඩසටහන | TOT | වේවැල් ආශ්‍රිත | අම්පාර, උහන ප්‍රා.ලේ.කො. ලාතුගල වේවැල් මධ්‍යස්ථානය | සැප්තැම්බර් 20 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 28 | | ඩබ්.එම්.පියරත්න මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 58 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | රෙදිපිළි | මහනුවර, නත්තරම්පොත | සැප්තැම්බර් 12 සහ 25 - දින2 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 42 | 2 | තමරා දමයන්ති මිය- සහකාරඅධ්‍යක්‍ෂ(මෝස්තර සංවර්ධන) |
| 59 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | UNDP | තල්කොළ | යාපනය - කයිට්ස් | ඔක්තෝම්බර් 28 සිට නොවැම්බර් 01-දින 5 | UNDP | 36 | 7 | චන්න පෙරේරා මයා - මෝස්තර සම්පාදක |
| 60 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | රතුමැටි | හම්බන්තොට- වීරකැටිය උඩුකිරිවිල | ඔක්තෝම්බර් 29 සිට නොවැම්බර් 01 -දින4 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 32 | 7 | විජිත බණ්ඩාර මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 61 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | TOT | රෙදිපිලි සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | අම්පාර | ඔක්තෝම්බර් 30-31 -දින 2 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 20 | 2 | තමරා දමයන්ති මිය- සහකාරඅධ්‍යක්‍ෂ(මෝස්තර සංවර්ධන) |
| 62 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | පන් හා කෙඳි | කොළඹ - පාදුක්ක | ඔක්තෝම්බර් 9-11 - දින 3 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 21 | 10 | එස්. ගම්ලත් මිය -සහකාර අධ්‍යක්‍ෂ (මෝස්තර සංවර්ධන) |
| 63 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | | තිර රෙදි | මහනුවර, නත්තරම්පොත | ඔක්තෝම්බර් 30-31හා නොවැ.4, 5 දින 4 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 31 | ක්‍රම 10 | පි.කේ. විජේසිංහ මයා - සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |
| 64 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | සම්පත්දයකත්වය ලබාදීම | රතුමැටි- ආභරණ | කොළඹ | ඔක්තෝම්බර් | යෞවන කටයුතු හා නිපුනතා අමාත්‍යාංශය | 32 | | ටොරින් චන්ද්‍රසේකර- මෝස්තර සංවර්ධන නිලධාරී |
| 65 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | රෙදි ආශ්‍රිත බෑග් | මාතලේ- ප්‍රා.ලේ.කාර්යාලය | නොවැ.27 දින 3 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 28 | 5 | පි.කේ. විජේසිංහ මයා - සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |
| 66 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | උණ ලී ආශ්‍රිත | කෑගල්ල | නොවැ.4 දින 02 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 18 | 6 | ඩබ්.එම්.පියරත්න මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 67 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | නවකයින් සඳහා | උණ ලී ආශ්‍රිත | ගම්පහ- මීගමුව | නොවැ.7 දින 04 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 10 | | ඩබ්.එම්.පියරත්න මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 68 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | UNDP -TOT | තල්කොළ | යාපනය | නොවැ.18 දින 4 | UNDP | 45 | | ඩබ්.එම්.පියරත්න මයා - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 69 | දැනුවත් කිරීමේ වැඩසටහන | TOT | කොහු | ගාල්ල | නොවැ.8 දින 1 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 20 | 7 | බර්නාඩ් මනතුංග මයා-සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) චන්න පෙරේරා මයා - මෝස්තර සම්පාදක |
| 70 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | පිත්තල | මහනුවර -කලාපුරය | නොවැ.12 දින 2 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 15 | 13 | ටොරින් චන්ද්‍රසේකර- මෝස්තර සංවර්ධන නිලධාරී |
| 71 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | කොහු | කළුතර- ප්‍රා.ලේ.කාර්යාලය | දෙසැම්බර් 9 දින 3 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 20 | 10 | බර්නාඩ් මනතුංග මයා-සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) චන්න පෙරේරා මයා - මෝස්තර සම්පාදක |
| 72 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | TOT | කොහු | ගාල්ල - බලපිටිය | දෙසැම්බර් 18- දින 3 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 20 | 10 | බර්නාඩ් මනතුංග මයා-සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) චන්න පෙරේරා මයා - මෝස්තර සම්පාදක |
| 73 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | නවකයින් | සම් | මහනුවර | දෙසැම්බර් 11- දින 3 | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 09 | 04 | පි.කේ. විජේසිංහ මයා - සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |
| 74 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන | රිදී ආභාරණ | මහනුවර - නිලවල | දෙසැම්බර් - දින | අමාත්‍යාංශය | | | පි.කේ. විජේසිංහ මයා - සහකාර අධ්‍යක්ෂ (නත්තරම්පොත) |
| 75 | දැනුවත් කිරීමේ වැඩසටහන | නවකයින් | විසිතුරු ආභරණ | යාපනය | දෙසැම්බර් 12 දින | අමාත්‍යාංශය | 232 | 35 | තුෂිනි ??????ත මිය මෝස්තර සම්පාදක |
| 76 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | දැව | කෑගල්ල - ලංකා කාර්මික සංවර්ධන | දෙසැම්බර් 1 - දින | කෑගල්ල - ලංකා කාර්මික සංවර්ධන | | | බර්නාඩ් මනතුංග මයා-සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) |
| 77 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | නවකයින් | රෙදිපිළි | කුරුණෑගල මල්කඩුවාව | දෙසැම්බර්1 0- දින | ජාතික මෝස්තර මධ්‍යස්ථානය | 15 | 02 | තමරා දමයන්ති මිය- සහකාරඅධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන) |

## නව නිර්මාණ හඳුන්වා දීම

කාලීන වෙළඳපල අවශ්‍යතා ඉලක්ක කරගනිමින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය, වෙලඳපලට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීමත්, ඒවායේ මූලික සාම්පල ආයතනයේ වැඩහල් තුල නිෂ්පාදනය කිරීමත් සිදු කරන අතර, එම නිර්මාණ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් හරහා මෙන්ම ආයතනයට පැමිණෙන ශිල්පීන්ගේ ඉල්ලීම මත හඳුන්වා දීමත් කරනු ලැබේ.

එමෙන්ම ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව පවත්වනු ලබන ශිල්පීයුගයට නිමැවුම්□ ප්‍රදර්ශණයේදී, ශිල්ප ජාතික ප්‍රදර්ශණයේදී හා වෙනත් සහභාගි වන ප්‍රදර්ශණ හරහා එම නිර්මාණ එළිදක්වනු ලැබේ.

ඒ අනුව 2013 වර්ෂය තුල නව නිර්මාණ 450ක් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට හඳුන්වාදීමට ඉලක්ක කළ අතර 519 ක් සපුරා ගැනීමට හැකියාව ලැබුණි.

## සංවර්ධන ව්‍යාපෘති හරහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ලබාදුන් දායකත්වය

"දිවි නැගුම" ජාතික සංවර්ධන වැඩසටහන
2011 වර්ෂයේ ආරම්භ කෙරුණු දිවි නැගුම ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ මෙම වර්ෂයේ ද සක්‍රිය දායකත්වයක් ලබාදෙමින් ක්‍රියාත්මක වූ ජාතික මෝස්තර මධ්‍යස්ථානය ගාල්ල, මාතර හා කළුතර යන දිස්ත්‍රික්කයන්හි නව නිර්මාණ පුහුණු වැඩසටහන් පැවැත්වීමටත්, මාතර, මොනරාගල හා යාපනය යන දිස්ත්‍රික්කයන්හි නව නිර්මාණ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ ප්‍රතිලාභීන්ට අවශ්‍ය උපකරණ හා යන්ත්‍ර සූත්‍ර ලබාදීමත් සිදු කරන ලදි.

## සාම්ප්‍රදායික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන

සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2012 වර්ෂයේ පහත සඳහන් ගම්මානයන්හි දැනුවත් කිරීමේ හා දත්ත රැස් කිරීමේ කටයුතු සිදු කෙරුණු සාම්ප්‍රදායිකහස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහනේ වැඩි කාර්යභාරයක් මෙම වර්ෂය තුල ක්‍රියාත්මක කෙරුණි. ඒ යටතේ නව නිර්මාණ සංවර්ධන හා තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් කාලීන වෙළඳපලට ගැලපෙන නව නිර්මාණ හඳුන්වාදීමටත්, වෙළඳපල සම්බන්ධතා ගොඩනංවා දීමටත් ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කරන ලදි.

| | හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ගම්මානය |
|---|---|---|---|---|
| 01 | ලාක්ෂා | මාතලේ | රත්තොට | පහළහපුවිද |
| 02 | දැව | ගාල්ල | බෝපේ පෝද්දල | බෝපේ පෝද්දල |
| 03 | සංගීත භාණ්ඩ | මාතර | මාතර | හිත්තටිය |
| 04 | වෙස්මුණු | කළුතර | හොරණ | බණ්ඩාරවත්ත, මව්ගම(බටුවිට) |
| 05 | සේසත් | මාතලේ | යටවත්ත | උනවේරුව |
| 06 | ආභරණ | මහනුවර | පහලහේවාහැට | නීලවල |
| 07 | සංගීත භාණ්ඩ | මහනුවර | උඩුනුවර | කුරගල |

## රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඒකාබද්ධව නව නිර්මාණ හදුන්වාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ජාතික මෝස්තර මධ්‍යස්ථානය, යූ.එන්.ඩී.පී. ආයතනය සමඟ එක්ව උතුරු පළාතේ හස්තකර්මාන්ත ශිල්පින් වෙනුවෙන් පවත්වන ලද නව නිර්මාණ සංවර්ධන හා වෙලඳපල සම්බන්ධතා ගොඩනැංවීමේ වැඩසටහන

## නව මෝස්තර සංවර්ධන හා නව තාක්ෂණික ප්‍රායෝගික පුහුණු වැඩසටහන- උතුරු පළාත

හස්ත කර්මාන්ත හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රධාන කොටගත් ක්ෂේත්‍රයන්හි නිෂ්පාදන කටයුතු ආර්ථිකමය වටිනාකමක් සහිතව සහ ඵලදායි අන්දමින් දිරි ගැන්වීම සඳහා ද පසුගිය 30 වසරක යුධමය ව්‍යසනයෙන් පීඩාවට පත් උතුරු පළාතේ හස්ත කර්මාන්ත ශිල්පීන් යලි නගා සිටුවීම අරමුණු කර දේශීය හා ජාත්‍යන්තර ඉල්ලුමට හා වෙළඳපල නැම්යාවන්ට උචිත වන අයුරින් වෙළඳපල ප්‍රවර්ධනය කරගැනීමට නිර්මාණාත්මක මෙන්ම, ගුණාත්මක නිෂ්පාදන එළිදැක්වීම සඳහා ශිල්පීන්ට අවශ්‍යවන උපදේශකත්වය තාක්ෂණික දැනුම සහ සහාය ලබාදීම උදෙසා උතුරු පළාතේ විසිරී සිටින හස්ත කර්මාන්ත ශිල්පීන්ට නව නිර්මාණාත්මක ශිල්පීය පුහුණුව ලබා දීම අරමුණු කොට යූඑන්ඩීපී ආයතනයේ අරමුදල් හා සම්බන්ධිකරණය ඇතිව යාපනය මුලතිව් හා කිලිනොච්චි යන දිස්ත්‍රික්ක ඉලක්ක කරගනිමින් එම දිස්ත්‍රික්කය තුල තල් ආශ්‍රිත හස්තකර්මාන්තයේ යෙදෙන, පුහුණුව ලැබූ හා ආධුනික තරුණ කණ්ඩායම් හා කාන්තාවන් සඳහා නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන් පවත්වා නව නිර්මාණ හරහා ඔවුන් වෙළඳපලට යොමු කරවීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කරන ලදි.

මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර වන නව නිර්මාණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2013 ජනවාරි මස ආරම්භ කරමින් දින 5 පුහුණු වැඩසටහන් 6ක් නිම කරන ලදි. ඊට අමතරව, 2013 ජනවාරි 18 දින සිට යාපනයේ පැවැත්වූ JITF ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශණය හා යාපනය නල්ලූර් කෝවිල් උත්සවයට සමගාමීව සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය මඟින් සංවිධානය කරන ලද ප්‍රදර්ශණය සඳහා එම ශිල්පීන් යොමු කරමින් නව නිර්මාණ වෙළඳකුටි හරහා ඔවුන්ට තම නිෂ්පාදන අලෙවි කරගැනීමට අවස්ථාව සලසා දෙන ලදි. එමෙන්ම, ක්‍රියාත්මක කළයුතු වෙළඳපල පර්යේෂණ, අලෙවි අවස්ථා ලබාදීම, දේශීය වෙළඳපල අවස්ථා ලබාදීම ආදී ව්‍යාපෘතියට අදාල ක්‍රියාකාරකම් ද මෙම ව්‍යාපෘතිය හරහා සිදු කරන ලදී

## යුගයට නිමැවුම් නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය

ශිල්ප -2013 ජාතික ප්‍රදර්ශනයට සමගාමීව ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව නිර්මාණ එළිදැක්වීම සඳහා යුගයට නිමැවුම් නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය 2013 අගෝස්තු මස 15 සිට 18 දක්වා සිරිමාවෝ බණ්ඩාරනායක ප්‍රදර්ශණ පරිශ්‍රයේදී පවත්වන ලද අතර, එහිදී නව නිර්මාණ 350කට අධික ප්‍රමාණයක් ප්‍රදර්ශණය කරමින් ශිල්පීන්ට එම නව නිර්මාණ හදුන්වාදීමත්, වෙළඳපල සම්බන්ධතා ගොඩනැංවීමත් සිදුකරන ලද අතර, ඒ හරහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් ශිල්පීන් 20 දෙනෙකුට අලෙවි කුටි පහසුකම් ලබාදෙමින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් හදුන්වාදෙන ලද, ශිල්පීන් විසින් නිෂ්පාදනය කරන ලද නිර්මාණ අලෙවි කරගැනිම සඳහා අවස්ථාව උදකර දෙන ලදී

එමෙන්ම තෝරාගත් නව නිර්මාණ 100ක් ඇතුලත් කර මුද්‍රණය කරන ලද නව නිර්මාණ අත්පොත, ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි ශිල්පීන්, ගැණුම්කරුවන් හා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත ලබාදෙමින් නව නිර්මාණ පිළිබඳ දැනුවත් කරන ලද අතර, ඒ හරහා නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත නිෂ්පාදන ජනයා අතර ප්‍රචලිත කිරීමට අවස්ථාව ලැබුණි

එමෙන්ම තෝරාගත් නව නිර්මාණ 100ක් ඇතුලත් කර මුද්‍රණය කරන ලද නව නිර්මාණ අත්පොත, ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි ශිල්පීන්, ගැණුම්කරුවන් හා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත ලබාදෙමින් නව නිර්මාණ පිළිබඳ දැනුවත් කරන ලද අතර, ඒ හරහා නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත නිෂ්පාදන ජනයා

# ජාතික මෝස්තර මධ්‍යස්ථානය හරහා උපදේශන සේවා

## මෝස්තර උපදේශක සේවා සම්බන්ධීකරණය

| සේවාව සඳහා ඉල්ලීම් කරන ලද ආයතනය | කාර්යය |
|---|---|
| ජාතික ශිල්ප සභාව | ශිල්ප 2012 සඳහා සම්මාන හා තිළිණ නිෂ්පාදනය |
| කාර්මික සංවර්ධන මණ්ඩලය | ශිල්ප 2012 සඳහා සම්මාන හා තිළිණ නිෂ්පාදනය |
| සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | දේශනේත්‍ර සම්මාන නිෂ්පාදනය |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | සැපයුම්කරුවන්ට සම්මාන පිරිනැමීමේ උළෙල 2013 සම්මාන නිෂ්පාදනය |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | කැලැන්ඩරය නිර්මාණය |

### ශිල්ප 2013 ප්‍රදර්ශණය

සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ උපදේශකත්වය ඇතිව ජාතික ශිල්ප සභාව විසින් සංවිධානය කර පවත්වනු ලැබූ උක්ත ප්‍රදර්ශණයේ පූර්ව රාජකාරි යටතේ දිස්ත්‍රික් මට්ටමින් හස්තකර්මාන්ත ශිල්පීන් දැනුවත් කිරීමේ සියළු වැඩසටහන් සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ දායකත්වය ලබාදෙමින් නව නිර්මාණ සම්බන්ධ උපදේශකත්වය ලබාදීමට කටයුතු කෙරුණි. ඊට අමතරව, ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව නිර්මාණ එළිදැක්වීමේ යුගයට නිමැවුම් නව නිර්මාණ ප්‍රදර්ශය ද ශිල්ප 2013 ප්‍රදර්ශණය සමඟාමීව පවත්වන ලදි.

### දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය

සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ මෙම ප්‍රදර්ශන පැවැත්වූ දින 10 තුල ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව නිර්මාණ එළිදැක්වීමේ ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යමින් හස්තකර්මාන්ත සඳහා උනන්දුවක් දක්වන්නන්ට අවශ්‍ය දැනුවත් කිරීම් හා සේවාවන් ලබාදෙන ලදි. ඊට අමතරව, මෙම ප්‍රදර්ශණය ඉලක්ක කරගනිමින් අම්පාර දිස්ත්‍රික්කයේ පාසැල් ලමුන්ට නව නිර්මාණ සංකල්ප හඳුන්වාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් ඔවුන්ව නව නිර්මාණ කිරීමට යොමු කරන ලදි. මේ සඳහා සිසුන් 431 දෙනෙකු සම්බන්ධ කරගත් අතර, ඔවුන් විසින් සිදුකරන ලද නව නිර්මාණ අතුරින් තෝරාගත් නිර්මාණ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේදී ප්‍රදර්ශණය කිරීමටත්, ජයග්‍රාහී නිර්මාණ සඳහා ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය කිරීමත්, මෙම ප්‍රදර්ශණ පරිශ්‍රය තුලදී සිදුකරන ලදී

#### අනෙකුත් ප්‍රදර්ශන සඳහා දායකත්වය

#### ව්‍යවසාය ප්‍රදර්ශනය

යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් සංවිධානය කර බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා, ප්‍රදර්ශණ පරිශ්‍රයේ දින 03ක් පුරා පවත්වන ලද මෙම ප්‍රදර්ශණයේ ප්‍රදර්ශණ කුටියක් අප ආයතනය විසින් පවත්වාගෙන යමින් නරඹන්නන් හට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සේවාවන් හා නව නිර්මාණ පිළිබඳ දැනුවත් කිරීම සිදුකරන ලදි.

වයඹ මල් දැක්ම ප්‍රදර්ශණය-

දින 04ක ප්‍රදර්ශණ කුටියක් පවත්වාගෙන යමින් ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සේවාවන් හා නව නිර්මාණ පිළිබඳ දැනුවත් කිරීම සිදුකරන ලදි.

බිංගිරිය මල් වසන්ත ප්‍රදර්ශණය-

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද දින 04ක් පුරා පවත්වන ලද මෙම ප්‍රදර්ශණය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය නව නිර්මාණ ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යමින් දායකත්වය දක්වන ලදි.

**පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට (Chogm) සමගාමීව නොවැම්බර් 13 සිට 17 දක්වා පවත්වන ලද රිෆ්ලෙක්ෂන් ඔෆ් 2013 ප්‍රදර්ශණය වෙනුවෙන් ආකර්ෂණීය ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාමටත්, සමුළුව වෙනුවෙන් හණ යොදා ගෙන ලිපි ගෙනු මළුවක්( File Bag) නිර්මාණය කර ඉදිරිපත් කරමින් ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ දායකත්වය දක්වන ලදි.**

ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා නව නිර්මාණ සංකල්පයන්හි වැදගත්කම -

උක්ත මාතෘකාව යටතේ ජාතික මොස්තර මධ්‍යස්ථාන විසින් සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය 2013.07.25 දින කාර්මික සංවර්ධන මණ්ඩල ශ්‍රවනාගාරයේදී පවත්වන ලද අතර, ඒ සඳහා උනන්දුවක් දක්වන්නන් 32 දෙනෙකු සහභාගි කර ගන්නා ලදි.

අලෙවි පර්යේෂණ වැඩසටහන

ලංකා හස්තකර්මාන්ත මණ්ඩලය සමඟ ඒකාබද්ධව ආරම්භ කරන ලද අලෙවි වැඩසටහන යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව නිර්මාණ සඳහා අලෙවි පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, ඒ හරහා ලැබෙන ඇනවුම් හස්තකර්මාන්ත ශිල්පීන්ට යොමු කර ඔවුන් හරහා වෙළපලට යොමු කරවීමේ සම්බන්ධිකරණය ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සිදුකරන ලද අතර, ඒ හරහා හස්තකර්මාන්ත ශිල්පීන්ගේ ආර්ථිකය නඟා සිටුවීමට අවස්ථාව ලැබුණි.

පුස්තකාල සේවා සහ තොරතුරු සැපයීම

කටුබැද්ද ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ මෙන්ම නත්තරම්පොත ශාඛා කාර්යාලයේ පිහිටි පුස්තකාල සඳහා වෙන්කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන හරහා මේ වර්ෂය වෙනුවෙන් පොත් මිලදී ගෙන පුස්තකාලය සංවර්ධනය කිරීමට කටයුතු කළ අතර, හස්තකර්මාන්ත ශිල්පීන් හා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් 168 දෙනෙකු සඳහා පුස්තකාල සේවා සහ තොරතුරු සැපයීම හා පොත් ආශ්‍රයෙන් අවශ්‍ය නිර්මාණයන්හි ඡායා පිටපත් ලබාදීමේ සේවාවද මේ හරහා සිදුකිරීමට කටයුතු කෙරුණි.

## පිරිනිර්මාණ අධ්‍යාපන හා පුහුණු කටයුතු

### ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ ආයතනය

පිරිනිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2013- 2014) (සති අන්ත)
මෙම වර්ෂයේදී උක්ත පාඨමාලාව සඳහා සිසුන් 28 දෙනෙකු සම්බන්ධ විය

පිරිනිර්මාණකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2011 - 2013) (සතියේ දිනවල)
2011 වර්ෂයේ මෙම පාඨමාලාව සඳහා සිසුන් 9 දෙනෙකු සම්බන්ධ විය

ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2011 - 2013) (සති අන්ත)
මෙම පාඨමාලාව සඳහා සිසුන් 05 දෙනෙකු සම්බන්ධ විය.

### ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය

2012 වර්ෂයේ ආරම්භ කරන ලද ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය මෙම වර්ෂය තුල 2990 දෙනෙකු භාවිතා කර ඇති අතර, හස්තකර්මාන්ත නව නිර්මාණ 167ක් මේ හරහා හදුන්වාදීමට කටයුතු කරන ලදි.

### ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවා ලබාදීම

2013 වර්ෂය තුල නව නිර්මාණ දැනුවත් කිරීමේ හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන්,ඇනවුම් හා අලෙවි අවස්ථා ලබාදීම,වෙළඳපල,ශිල්පීන්, ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ලබාදීම, ආයතනයේ වැඩහල තුල ප්‍රායෝගික පුහුණුව ලබාදීම,පොදු පහසුකම් ලබාදීම, ආයතනයට පැමිණ/ ඉල්ලීම් මත මෝස්තර ලබාදීම (ග්‍රැෆික් නිර්මාණ ඇතුළුව), පුස්තකාල සේවා ලබාදීම
අලෙවි ප්‍රවර්ධනය හා අලෙවි පර්යේෂණ වැඩසටහන් වැනි සේවාවන් හරහා 2509 දෙනෙකුට සේවාවන් ලබාදිමට ජාතික මෝස්තර මධ්‍යස්ථානයට කටයුතු කර ඇත.

ඊට අමතරව, හස්තකර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන හා අධ්‍යන කටයුතු සිදුකරන විශ්ව විද්‍යාල හා පාසල් සිසුන්ට ව්‍යාපෘති සඳහා න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමත් අනෙකුත් පාර්ශවයන් දැනුවත් කිරීම් හා තොරතුරු සැපයීම වැනි සේවාවන් 812 දෙනෙකු හට ලබාදී ඇත.

# ජාතික මෝස්තර මධ්‍යස්ථානය
# භෞතික ප්‍රගතිය - 2013දෙසැම්බර් 31 දිනට

| | ව්‍යාපෘතිය/වැඩසටහන/ක්‍රියාකාරකම් | භෞතිකප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | සපුරා ගැනීම |
| 1 | නව නිර්මාණ සැලසුම් කිරීම සහ සංවර්ධනය | | |
| 1.1 | සැලසුම් කරන ලද නව නිර්මාණ සංඛ්‍යාව | 685 | 748 |
| 1.2 | සංවර්ධනය කරන ලද නව සාම්පල සංඛ්‍යාව | 365 | 395 |
| 1.2.1 | මොරටුව වැඩහලේ නිමකරන ලද මූලික සාම්පල් සංඛ්‍යාව | 315 | 278 |
| 1.2.2 | නත්තරම්පොත වැඩහලේ නිමකරන ලද මූලික සාම්පල් සංඛ්‍යාව | | 102 |
| 1.3 | ආයතනයේ අවශ්‍යතාවය මත පිටත ශිල්පීන් මගින් නිෂ්පාදනය කරගත් නිර්මාණ සංඛ්‍යාව | 50 | 15 |
| 2 | නව නිර්මාණ දැනුවත් කිරීමේ හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් | | |
| 2.1 | නව නිර්මාණ දැනුවත් කිරීමේ වැඩසටහන් | 10 | 13 |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 330 | 640 |
| 2.2 | නව නිර්මාණ හදුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් | 50 | 54 |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1000 | 1286 |
